# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2231/21 - 2021 ජුනි මස 11 වැනි සිකුරාදා - 2021.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 66370 දරන අංක 700, මීගමුව පාර, මත්තුමගල, රාගම යන ස්ථානයෙහි පිහිටා ඇති ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හෙල්ත් සයන්ස් (පීවීටී) එල්ටීඩී ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති, එයට අනුරූපීව මෙහි II උපලේඛනයේ II වැනි තීරයේ දක්වා ඇති කෙටි යෙදුම අදාළ උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හෙල්ත් සයන්ස් (පීවීටී) එල්ටීඩී ආයතනය මේ නියමය මගින් පිළිගනු ලැබේ.

**I වැනි උපලේඛනය**

***කොන්දේසි***

1. මෙම නියමය මගින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හෙල්ත් සයන්ස් (පීවීටී) එල්ටීඩී ආයතනය විසින්, නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු විෂයය ප්‍රතිසමාලෝචනයට යටත්ව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව පිරිනමනු ලැබිය හැකි ය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හෙල්ත් සයන්ස් (පීවීටී) එල්ටීඩී ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදළ උපාධි පාඨමාලාව, අංක 700, මීගමු පාර, මත්තුමගල, රාගම යන ස්ථානයේ දී පමණක් පැවැත්විය යුතු ය.

3. ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හෙල්ත් සයන්ස් (පීවීටී) එල්ටීඩී විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදළ උපාධි පාඨමාලාවට සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී වාණිජ විෂයය ධාරාව යටතේ සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුණු පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක්,

යන ඇතුළත්වීමේ අවම සුදුසුකම් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතු ය.

## II වැනි උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය | බීබීඒ (ගෞරව) |

මහාචාර්ය **ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2021 මැයි මස 20 වැනි දින,
කොළඹ දී ය.

06 - 270

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.